"කාර්යක්‍ෂමතාවයෙන් යුත් වගවීමක් සහිත පළාත් සභා රාජ්‍ය සේවයක්"

# ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு
# Uva Provincial Council Public Service Commission

14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල. 14/4, பீலிபொத்தகம வீதி, பிங்கராவ, பதுளை. 14/4, Peelipothagama Road, Pinarawa, Badulla.

මගේ අංකය / எனது இல / My No. } 3/1B/1/1-20

ඔබේ අංකය / உமது இல / Your No. } ..................

දිනය / திகதி / Date } 2014.05.

5/ආ/1/1

ඌව පළාත් සභාව - බදුල්ල

06 MAY 2014

ලේකම්,
ඌව පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශය,
ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.

**සලසුම් හා වැඩ සටහන් සහකාර තනතුර සඳහා බඳවා ලැනීමේ පරිපාටියේ පිටපතක් ලබා ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක 5/ආ/1/41 හා 2014.04.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සහතික කරන ලද පිටපතක් මේ සමඟ ඔබ වෙත එවන බව කාරුණිකව දන්වා සිටිමි.

සී.ඒ.හේරත්
සහකාර ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| | | | | | |
|---|---|---|---|---|---|
| ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman | 055 - 2222150 | ලේකම් / ෆැක්ස් / செயலாளர் / பெக்ஸ் / Secretary / Fax | 055 - 2223482 | සහකාර ලේකම් / உ.தவிசெயலாளர் / Asst.Secretary | 055 - 2225148 |
| නිවස / இல்லம் / Residence | 055 - 2222769 | පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | 055 - 3052178 | General / Web | 055-2222400 / www.psc.up.gov.lk |

70

<u>ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ</u>

<u>සැලසුම් හා වැඩසටහන් සහකාර</u>

<u>තනතුර සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය</u>

01. තනතුරු නාමය - සැලසුම් හා වැඩසටහන් සහකාර

02. තනතුර අයත් දෙපාර්තමේන්තුව - ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශය - ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය

03. ක්‍රියාත්මක වන දිනය - 2006.01.01

04. අර්ථ නිරූපනය

04.1 බඳවා ගැනීමේ පරිපාටිය යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර සේවයේ බඳවා ගැනීමේ පරිපාටිය වේ.

04.2 කොමිෂන් සභාව යනුවෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

04.3 ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයා වේ.

04.4 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

04.5 අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ, ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

04.6 දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වේ.

04.7 " සේවාව " යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර සේවය වේ.

04.8 මෙම බඳවා ගැනීමේ පරිපාටියට අදළ කාර්යයන් සඳහා " සතුටුදායක සේවා කාලය " යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර පහ (05) ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද ඒ කාලය තුළ කළ වරදකට අවවාද කිරීමක් හැර දඬුවමක් ලබා නැත්තා වූ ද සේවා කාලයකි.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/03/06
ලේකම් / ~~සහකාර ලේකම්~~ / ප්‍රධාන නිලධාරී
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

05. තනතුරේ සාරාංශය

විධායක හා කළමනාකරණ මට්ටම්වල කාර්යභාරයට සහාය වන්නා වූ ද කාර්යයන් ඉටු කිරීම සඳහා විමර්ශන, තොරතුරු හා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය, සම්පාදනය, වාර්තා සම්පාදනය, සමීක්ෂණ වැනි කාර්යයන් මෙම තනතුරට අදාළ වේ.

06. සේවා කොන්දේසි

06.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

06.2 තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහය , මුදල් රෙගුලාසි, ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග, රෙගුලාසි හා රජය මඟින් හෝ ඌව පළාත් සභාවේ යම් අධිකාරියක් මඟින් දැනට ක්‍රියාත්මක කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට ද යටත් විය යුතු ය.

06.3 පත්වීමේ දින සිට වසර පහ (05) ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

06.4 ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේද වල විධිවිධාන ද අදාළ වේ.

07. සේවක ව්‍යුහයන් හා වැටුප් පරිමාණ

07.1 සේවක ගණය හා වර්ගීකරණ මට්ටම්
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව
ආශ්‍රිත නිලධාරීන් - ද්විතීය මට්ටම

07.2 සේවක ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව MN – 4 – 2006 A
රු: 14,850 – 10 X 185 – 4 X 210 – 15 X 290 – 7 X 320 – 24,130/

08. බඳවා ගැනීමේ සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, සංඛ්‍යාණය, භූගෝල විද්‍යාව, රසායන විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් සමඟ ශාස්ත්‍රවේදී විද්‍යාවේදී හෝ වාණිජවේදී උපාධිය සමත්ව තිබීම.

(ආ) පොදු යෝග්‍යතා

1. ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනට අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
2. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.
3. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
4. ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර තුන (03) ක වත් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු ය. ඡන්ද හිමි නාමලේඛණයෙන් හෝ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන පදිංචිය පිළිබඳ සහතිකයක් මඟින් පදිංචිය සනාථ කළ යුතු ය.

09. බඳවා ගැනීමේ ක්‍රමය

09.1 ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරිණියන්ගෙන් බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හා 30/91 හි සඳහන් විධි විධාන අනුව බඳවා ගනු ලබන අතර පුරප්පාඩු ප්‍රමාණයට සමාන හෝ ඊට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් සිටින විට ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමකින් පසුව පත්වීම් සඳහා තෝරා ගනු ලැබේ. පුරප්පාඩු ප්‍රමාණයට වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සිටින විට ඔවුන් තරග විභාගයකට යොමු කර එහි දී දක්වන කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව තෝරා ගනු ලැබේ.

09.2 සේවක ගණය සඳහා බඳවා ගනු ලබන්නේ සේවක ගණයේ III ශ්‍රේණියට පමණි.

බඳවා ගැනීමේ විභාගයේ විෂය නිර්දේශය

විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

1. අභියෝග්‍යතාවය
2. පොදු ප්‍රශ්න පත්‍රය

| විෂය | කාලය (පැය) | ලකුණු |
|---|---|---|
| 01. අභියෝග්‍යතාවය<br>මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ භාෂාමය කුසලතාවය, සංඛ්‍යාමය හැකියාව,තර්කානුකූල ශක්තිය,විශ්ලේෂණ-සංස්ලේෂණ හැකියාව, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ආදිය මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකි. | 1 | 100 |



මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/05/06
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරි
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

| | | |
|---|---|---|
| 02. පොදු ප්‍රශ්න පත්‍රය<br>මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සමාජ,ආර්ථික,දේශපාලන තොරතුරු ඇතුලත් කරනු ලැබේ. | 01 1/2 | 100 |
| මුළු ලකුණු | | 200 |

මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% ක් වත් අපේක්ෂකයින් ලබා ගත යුතු වේ.

10. කාර්යක්ෂමතා කඩඉම

වැටුප් පරිමාණයෙහි 04 හා 07 වන වැටුප් පියවර වලට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් වේ. වයස නිසා කඩඉම් වලින් නිදහස් කරනු නොලැබේ. එය ලිඛිත පරීක්ෂණයක් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්/ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මඟින් පවත්වනු ලැබේ.

වැටුප් පරිමාණයෙහි 04 වන හා 07 වන වැටුප් පියවර වලට ප්‍රථම සමත්විය යුතු කඩඉම් පරීක්ෂණ පිළිවෙලින් පළමු හා දෙවන කඩඉම් පරීක්ෂණ ලෙස හැඳින් වේ.

කඩඉම් පරීක්ෂණ වල සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 100 බැගින් වේ. නිලධාරීන් එක් විෂයකින් සමාර්ථය ලැබීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් වත් ලබාගත යුතු ය.

එකී කාර්යක්ෂමතා කඩඉම් වල විෂය නිර්දේශය පහත පරිදි වේ.

පළමු කාර්යක්ෂමතා කඩඉම

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. එම ප්‍රශ්ණ පත්‍රයන්හි විෂය නිර්දේශය හා පිළිතුරු ලිවීමට වෙන් කරන කාලය පහත පරිදි වේ.

පළමුවන ප්‍රශ්න පත්‍රය

ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි - කාලය පැය 03 යි.

I. ආයතන සංග්‍රහයේ පළමු බාණ්ඩයේ i , vii, xii, xiv පරිච්ඡේද
II. ආයතන සංග්‍රහයේ දෙවන බාණ්ඩයේ සියළුම පරිච්ඡේද
III. මුදල් රෙගුලාසි iii, iv, v පරිච්ඡේද

දෙවන ප්‍රශ්න පත්‍රය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පළාත් සභා පනත සහ ඊට අදාළ කරුණු කාලය පැය 02

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි 13 වන සංශෝධනය
II. පළාත් සභා පනත සහ එහි සංශෝධන
III. අනුෂාංගික විධිවිධාන පනත



මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/03/10
ශ්‍රී ලංකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

IV. පළාත් සභා ප්‍රඥප්ති හා රෙගුලාසි

V. පළාත් සභාවේ සංවිධාන ව්‍යුහය, එහි විවිධ මට්ටම් හා ආයතන වලට පැවරෙන වගකීම් හා කාර්යයන්

දෙවන කාර්යක්ෂමතා කඩඉම

මෙම විභාගය ප්‍රශ්ණ පත්‍ර 03 කින් සමන්විත වේ. එම ප්‍රශ්න පත්‍රයන්හි විෂය නිර්දේශය හා පිළිතුරු ලිවීමට වෙන් කරන කාලය පහත පරිදි වේ.

එක් ප්‍රශ්න පත්‍රයකට උපරිම ලකුණු 100 ක් වන සේ ලැබෙන අතර එක් එක් විෂයකින් සාමාර්ථය ලැබීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් වත් ලබාගත යුතු ය.

අ. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය (කාලය පැය 02)

I. කාර්යාල ක්‍රම හා ඒවායේ වැදගත්කම.
II. කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම.
III. ලිපි ගනු දෙනු කිරීමේ මාර්ග.
IV. කාර්ය පරිපාටි හා වාර්තා ගත කිරීමේ ක්‍රියා පරිපාටිය.
V. මහජන සම්බන්ධතාව.

ආ. මුදල් රෙගුලාසි (කාලය පැය 02)

I. වියදම් හා ආදායම් ඇස්තමේන්තු (1 පරිච්ඡේදය)
II. වියදම් අත්හැර දැමීම් ආපසු ගෙවීම ආදිය සඳහා අධිකාරි බලය (II පරිච්ඡේදය)
III. ආණ්ඩුවේ මුදල් යන ආදියේ භාරකාරිත්වය හා බැංකු ගිණුම් (vi පරිච්ඡේදය)
IV. සැපයුම් වැඩ හා සේවා (xiii පරිච්ඡේදය)

ඇ. කළමනාකරණය (කාලය පැය 02)

පහත සඳහන් විෂය ධාරාව ඇතුලත් ය.

I. සංවර්ධන කටයුතු හා සංවර්ධනය පිළිබඳ සමස්ථ අරමුණු.
II. සැලසුම් කිරීම, මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය.
III. තොරතුරු එක්රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය.
IV. සහභාගිත්ව සංවර්ධන සංකල්ප හා උපාය මාර්ග
V. රාජ්‍ය නොවන සංවිධාන හා ස්වෙච්ඡා සංවිධාන
VI. රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය

11. බලධරයින්

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/05/06
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරී
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

14. පාලනය

ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර සේවාව මෙම බඳවා ගැනීමේ පරිපාටියෙන් පාලනය වේ. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සළසා නොමැති කරුණු පිළිබඳ ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධිවිධාන ප්‍රකාශ සංශෝධන ඇතුලත් කර සැකසූ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර තනතුරේ බඳවා ගැනීමේ හා උසස් කිරීම සඳහා සකස් කරන ලද පටිපාටිය බව සහතික කරමි.

අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

දිනය : 2011 - 08 - 22

විශේෂඥ වෛද්‍ය තිලකසිරි රාජපක්ෂ හේවාගීගන
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ඌව

අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශය:

නිර්දේශ කරමි/ නොකරමි.

අංකය

දිනය 2011 . 08 . 22

අත්සන එච්.එම්.එස්.පී. අබන්වල
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සහ පළාත් කටයුතු අමාත්‍යාංශය
ඌව පළාත් සභාව, බදුල්ල.

(නිල මුද්‍රාව)

ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:

නිර්දේශ කරමි/ නොකරමි.

අංකය

දිනය : 01.09.2011

අත්සන

(නිල මුද්‍රාව)

ප්‍රධාන ලේකම්, ඌව පළාත

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/05/06
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කොමිෂන් සභාවේ අනුමැතිය

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි.

1. සභාපති : ..............................

2. සාමාජික : ..............................

3. සාමාජික : ..............................

4. සාමාජික : ..............................

5. සාමාජික : ..............................

දිනය : 2011/09/01

ආණ්ඩුකාරවර ලේකම්,

2011. 09. 01 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ....09.... යටතේ මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සැලසුම් හා වැඩසටහන් සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ සංශෝධිත පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

(ආර්.එම්.ටී.බී. හාතියල්දෙණිය)
ලේකම්
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2011. 09. 01

අනුමත කරමි/නොකරමි.

(සී. නන්ද මැතිව්)
ඌව පළාත් ආණ්ඩුකාරවර

සී. නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

දිනය : 2011. 09. 01

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/03/06
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරී
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව